මාධ්‍ය වාර්තාකරණයේදී සමාජයේ කිසිවෙකු සම්බන්ධයෙන් කොන් කිරීමේ හෝ වෙනස් කොට සැලකීමේ ආකල්පයකින් පුවත් වාර්තා නොකිරීම හෝ, එවැනි ආකල්පයක් සමාජය තුළ ඇති නොකිරීමට සවිඥාණික වීම, මාධ්‍ය මාර්ගෝපදේශයන්හි අවධාරණය වන කරුණකි. ආචාර ධාර්මික මාධ්‍යකරණය විය යුත්තේ ද එයයි.

ලංකාදීප පුවත්පතේ (මාර්තු 22, 2022) දෙයියෝ සාක්කි තීරුවේ “සක්කර වට්ටමක් කරේ එල්ලුවාට නැන්දම්මාට මළ පැනලා” යන සිරස්තලය යටතේ පළවූ ලිපියකි. එහි අන්තර්ගතයේ සඳහන් වූයේ, මනාලිය "බිහිරි" බවත්, මඟුල් කපුකම කළ අය ඒ බව වසන් කර ඇයව විවාහ කර දී ඇති බවත්ය වේ.

ඔබ සිතනා ලෙසට,

1) ශ්‍රවණ ආබාධයක් සහිත තැනැත්තියක හැඳින්වීමට “සක්කර වට්ටමක්” වැනි යෙදුමක් භාවිතා කිරීමත්, පුවත් වාර්තාව තුළ ශ්‍රවණ ආබාධයක් සහිත වීම "අඩුපාඩුවක්" ලෙසින් සලකා තිබීම සහ, එම ආබාධ තත්වය සම්බන්ධයෙන් ගර්හාත්මකව සඳහන් කර තිබීම, ආබාධ සහිතව ජීවත් වන්නවුන් කොන් කිරීමක් නොවන්නේ ද?

2) එමෙන්ම, ආබාධ සහිත පුද්ගලයන් හැඳින්වීම සඳහා “බිහිරි” වැනි යෙදුම් වෙනුවට, “ශ්‍රවණ ආබාධ සහිත”/ “ශ්‍රවණාබාධ සහිත” වැනි පුද්ගල ප්‍රථම භාෂාවක් භාවිතා කිරීම වඩාත් යෝග්‍ය නොවන්නේ ද?